**SAITM Media statement**

The Board of Management of South Asian Institute of Technology & Medicine, wishes to place on record the following facts in the interest of the general public with regard to the ongoing investigations by CID on Mr. Wasim Thajudeen case.

Human body specimens and bones are kept at our institution only for purposes of education as is a common practice in most medical faculties. The said specimens are securely kept at our Museum for medical teaching, which is an integral part of the medical undergraduate programme for which SAITM is recognized as Degree Awarding Institute as per Gazette Notification nos. 1721/19 dated 30/11/2011 and 1829/36 dated 26/09/2013 to award the degree Bachelor of Medicine and Bachelor of Surgery. Our request for bones for educational purposes was made in 2011, far prior to the death of Mr. Thajudeen.

All specimens received by SAITM have been taken over after following the due and established process and the take over is documented, supervised and certified by the relevant authorities. We have secured approval both from the Police and from the Kaduwela Pradeshiya Sabha for this purpose.

The list given to us when issuing bones did not contain the name of Wasim Thajudeen. SAITM has no control over the procedures of issuing bones from the JMO office and our records do not reveal that any body part of Mr.Wasim Thajudeen had been sent to SAITM.

No sooner than it was highlighted that the bones kept at SAITM are the subject matter of an investigation, the Vice Chancellor Prof. Samarasekera voluntarily took a leave of absence, to ensure that there is absolute transparency in all investigations to be conducted at SAITM by the CID.


Registered Address: No. 60, Suhada Mawatha, Millennium Drive, off Chandrika Bandaranaike Kumarathunga Mawatha, Malabe, Sri Lanka.
Telephone: +(94) 112 413331, +(94) 112 413351, +(94) 112 407183/4 Fax: +(94) 112 413332 Email: info@saitm.edu.lk

## SAITM මාධ්‍ය නිවේදනය

වසීම් තාජුඩීන් නඩුවිභාගය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මේ වනවිට සිදුකරමින් පවතින පරීක්ෂණවලට අදාළ වැදගත් කරුණු කිහිපයක් ජනතාව වෙත දැනුම්දීම සඳහා තාක්ෂණය හා වෛද්‍ය විද්‍යාව පිළිබඳ දකුණු ආසියානු ආයතනය (South Asian Institute of Technology & Medicine - SAITM) මගින් මෙම මාධ්‍ය නිවේදනය නිකුත් කර ඇත.

බොහෝ වෛද්‍ය විද්‍යාලවල සාමාන්‍යයෙන් සිදුවන පරිදි අපගේ වෛද්‍ය විද්‍යාලය තුළ ද මිනිස් ශරීර කොටස් සහ අස්ථි කොටස් ගබඩා කොට තබාගනු ලබන්නේ අධ්‍යාපන කටයුතුවලදී භාවිතා කිරීම සඳහා පමණි. තාක්ෂණය හා වෛද්‍ය විද්‍යාව පිළිබඳ දකුණු ආසියානු ආයතනය හෙවත් SAITM යනු 2011/11/30 දින පළකරන ලද අංක 1721/19 දරන ගැසට් නිවේදනය සහ 2013/09/26 දින පළකරන ලද අංක 1829/36 දරන ගැසට් නිවේදනයට අනුව Bachelor of Medicine සහ Bachelor of Surgery යන උපාධි පිරිනැමීම සඳහා බලය හිමි ආයතනයක් ලෙස පිළිගෙන ඇති අතර මෙම ශරීර කොටස් අප ආයතනයේ වෛද්‍ය උපාධි පාඨමාලාවේ අධ්‍යයන කටයුතු සඳහා අපගේ කෞතුකාගාරයේ සුරක්ෂිත ලෙස තැන්පත් කර තිබේ. අධ්‍යාපන අරමුණු සඳහා අස්ථි කොටස් ලබාදෙන ලෙස අප ඉල්ලීමක් ඉදිරිපත් කර තිබුණේ 2011 වසරේදී තාජුඩීන් මහතාගේ මරණයට බොහෝ කලකට පෙර ය.

SAITM ආයතයනය වෙත ලැබුණු සියලුම ශරීර කොටස් නිසි ක්‍රියාවලි අනුගමනය කරමින් සහ නිසි බලධාරීන්ගේ සහතිකය යටතේ භාරගෙන ඇති අතර, එම භාරගැනීමේ ක්‍රියාවලිය නිසි ලෙස වාර්තා වලට ඇතුළත් කර ඇත. මේ සඳහා ශ්‍රී ලංකා පොලීසියේ මෙන්ම කඩුවෙල ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ද අප වෙත හිමිවී තිබේ.

කෙසේ වෙතත් ශරීර කොටස් භාරදීමේදී අප වෙත ලබා දුන් ලැයිස්තුවේ වසීම් තාජුඩීන් යන නම සඳහන් වී නැත. අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් අස්ථි කොටස් නිකුත් කිරීම සම්බන්ධයෙන් අප ආයතනයේ සම්බන්ධයක් නොමැති අතර වසීම් තාජුඩීන් මහතාගේ ශරීර කොටස් අප ආයතනය වෙත එවන ලද බවක් අපගේ වාර්තාවල සඳහන් නොවේ.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන පරීක්ෂණයට SAITM ආයතනය ද සම්බන්ධ බව නිශ්චිත වශයෙන් දැනගත් පසුව, එම පරීක්ෂණයේ විනිවිදභාවය ආරක්ෂා කිරීමට දායක වීමක් වශයෙන් ආයතනයේ උපකුලපති මහාචාර්ය සමරසේකර මහතා ස්වේච්ඡාවෙන් සේවයෙන් නිවාඩු ලබාගැනීමට කටයුතු කළේ ය.

**2016 ඔක්තෝබර් 10**